අධිකරණ අමාත්‍යාංශය

ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා / අධිකරණ ඝෝෂක හා ප්‍රවේශක තනතුරු සඳහා බඳවා ගැනීම (සීමිත පදනම මත) - 2017

අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පවතින සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා තනතුරු 134 ක් සහ අධිකරණ ඝෝෂක හා ප්‍රවේශක තනතුරු 17 ක් සඳහා සීමිත පදනම මත පුද්ගලයන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් **ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, තැ.පෙ. 555, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12** යන ලිපිනයට 2017-06-02 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පවතින සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා / අධිකරණ ඝෝෂක හා ප්‍රවේශක තනතුරු සඳහා බඳවා ගැනීම**" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

සටහන - ඉල්ලුම් පත්‍රයක් හෝ ඊ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය -

ලිඛිත පරීක්ෂණයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. සෑම අයදුම්කරුවෙක් විසින්ම උක්ත තනතුරු දෙක සඳහා තම කැමැත්තේ අනුපිළිවෙළට මනාපය 01 සහ 02 ලෙස සඳහන් කළ යුතුය. ලිඛිත පරීක්ෂණයෙන් හා යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණය යන දෙකෙන්ම ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා හා අධිකරණ ඝෝෂක හා ප්‍රවේශක තනතුරු වලට බඳවා ගනු ලැබේ.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි -

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

සටහන - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට යටත් විය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියකු වසරක (වසර 01 ක) වැඩ බැලීමේ කාලයකට යටත් වන අතර, වසර 03 ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවෙන් තොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය.

(iv) සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009-02-20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලකා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

03. වැටුප් පරිමාණය -

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව PL-2-2016,රු.25,250-10X270-10X300-10X330-12X350-රු. 38,450/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. (2016/02/25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි II වන උප ලේඛනය පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

04. සුදුසුකම් -

(i) අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්වී තිබීම.

සටහන : අධිකරණ අමාත්‍යාංශයේ සංචාරක අධිකරණ ආරක්ෂක / අධිකරණ ආරක්ෂක, පිස්කල් පියන්, පිස්කල් භාරකාර මාතා හෝ කාර්යාල කාර්ය සේවක සේවයේ තනතුරු වලට අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල නොසලකා බඳවා ගෙන ඇති නිලධාරීන් මෙම අවස්ථාවට පමණක් 8 වන ශ්‍රේණිය සමත්වීම අධ්‍යාපන සුදුසුකම් සේ සලකනු ලැබේ.

(ii) පළපුරුද්ද :

සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා තනතුර සඳහා :

(i) සංචාරක අධිකරණ ආරක්ෂක / අධිකරණ ආරක්ෂක, පිස්කල් පියන් තනතුරක වසර 05 ක සේවා කාලයක් සපුරා තිබීම හා තනතුරේ ස්ථිර කර තිබීම

හෝ

(ii) කාර්යාල සේවක සේවයේ වසර 05 ක සේවා කාලයක් සපුරා තිබීම, තනතුරේ ස්ථිර කර තිබීම සහ අධිකරණ අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක හෝ අධිකරණයක හෝ / හා දැන්වීම ප්‍රසිද්ධ කරන දිනට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

අධිකරණ ඝෝෂක හා ප්‍රවේශක තනතුර සඳහා :

(i) සංචාරක අධිකරණ ආරක්ෂක / අධිකරණ ආරක්ෂක, පිස්කල් පියන් තනතුරක වසර 05 ක සේවා කාලයක් සපුරා තිබීම හා තනතුරේ ස්ථිර කර තිබීම

හෝ

(ii) කාර්යාල සේවක සේවයේ වසර 05 ක සේවා කාලයක් සපුරා තිබීම, තනතුරේ ස්ථිර කර තිබීම සහ අධිකරණ අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක හෝ අධිකරණයක හෝ / හා දැන්වීම ප්‍රසිද්ධ කරන දිනට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

හෝ

(iii) පිස්කල් භාරකාර මාතා තනතුරේ වසර 05 ක සේවා කාලයක් සපුරා තිබීම හා තනතුරේ ස්ථිර කර තිබීම.

සටහන - සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා තනතුර සඳහා පිරිමි අයදුම්කරුවන්ද අධිකරණ ඝෝෂක හා ප්‍රවේශක තනතුර සඳහා කාන්තා සහ පිරිමි අයදුම්කරුවන්ද බඳවා ගැනේ.

05. වයස් සීමාව - අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 නොඅඩු විය යුතු අතර, උපරිම වයස් සීමාව අදාළ නොවේ.

06. කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. වෙනත් සුදුසුකම් -

(i) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කර ඇති දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iii) අදාළ තනතුරුවල වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 05 උපයාගෙන තිබීම.

(iii) පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

(v) අදාළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

08. ලිඛිත පරීක්ෂණය

2017 අගෝස්තු මස කොළඹදී පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයෙන් හා යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණය යන දෙකෙන්ම ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ.

09. ලිඛිත පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්‍රමය -

විෂයයන්	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
ලංකාවේ දැනට ක්‍රියාත්මක වන අධිකරණ පිළිබඳ අවබෝධය විනිශ්චය ශාලාවන සම්ප්‍රදායන් හා ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය, අධිකරණ අමාත්‍යාංශය සතු කාර්යභාරය පිළිබඳ අවබෝධය	කාලය පැය 1 (මුළු ලකුණු 100) බහුවරණ හා ව්‍යුහගත ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.	ලකුණු 40

10. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	තෝරා ගැනීමට සලකා බලනු ලබන ලකුණු ප්‍රමාණය
අතිරේක අධ්‍යාපන සුදුසුකම්	25	අදාළ නොවේ.
අතිරේක පළපුරුද්ද	50	
අතිරේක වෘත්තීය සුදුසුකම්	20	
සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය	05	
මුළු ලකුණු	100	

11. ඉල්ලුම්පත්‍රය සෙ.මී. 21x29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතු අතර, 01-11 දක්වා ශීර්ෂ ඉල්ලුම්පත්‍රයේ පළමු වන පිටුවේද 12 සිට ඉතිරිය දෙවන පිටුවටද වන පරිදි එම ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන්ම සැලකිය යුතුය. ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

පද්මසිරි ජයමාන්න
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

ආදර්ශ අයදුම්පත්‍රය

අධිකරණ අමාත්‍යාංශය

අංකය : ....
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

තනතුර	මනාපය
සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා	
අධිකරණ ඝෝෂක හා ප්‍රවේශක	
අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 1.0 ඡේදයට අනුව කැමැත්තේ අනුපිළිවෙළට මනාප අංකය සඳහන් කරන්න. (මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ).	

විභාගයට පෙනී සිටින භාෂා මධ්‍යය :
සිංහල - 2 දෙමළ - 3 ඉංග්‍රීසි - 4 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) (මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා / අධිකරණ ඝෝෂක හා ප්‍රවේශක තනතුරු සඳහා අයදුම්පත්‍රය (සීමිත පදනම මත)

01. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන් / දෙමළෙන්) :
....
....
මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
....
....
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ....
....
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....
....
02. ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) : ....
....
03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....
....
04. දුරකථන අංකය : ....
05. ජාතික හැඳුනුම්පත් අංක : ☐☐☐☐☐☐☐☐☐☐
06. ස්ත්‍රී / පුරුෂ භාවය : ....
07. උපන් දිනය : වර්ෂය .... මාසය .... දිනය ....
08. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය වයස : වර්ෂය .... මාස .... දින ....
09. ජාතිය : ....
10. විවාහක / අවිවාහක බව : ....
11. (අ) දැනට දරන තනතුර : ....
(ආ) සේවා ස්ථානය : ....
(ඇ) පත්වීමේ දිනය : ....
(ඈ) පත්වීම ස්ථිර කළ දිනය : ....
(ඉ) එම තනතුරේ සේවා කාලය : ....
12. පෙර සේවා ස්ථානවල තොරතුරු :

අනු අංකය	තනතුර	සේවා ස්ථානය	සේවා කාලය

13. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර
වර්ෂය හා මාසය ....
විභාග අංකය ....

විෂය	ශ්‍රේණිය	විෂය	ශ්‍රේණිය
01.		06.	
02.		07.	
03.		08.	
04.		09.	
05.		10.	

අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර
වර්ෂය හා මාසය ....
විභාග අංකය ....

විෂය	ශ්‍රේණිය
01.	
02.	
03.	
04.	
05.	

14. වෙනත් සුදුසුකම් :
....
....
....
....
....
15. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)
ඔව් ☐ නැත ☐

අයදුම්කරුගේ සහතිකය

.... වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළි වුවහොත් නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

....
දිනය : ....
අයදුම්කරුගේ අත්සන

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .... මයා/මිය/මෙනවිය....../....../.......... දින සිට .... අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / අධිකරණයේ / කම්කරු විනිශ්චය සභාවේ .... වශයෙන් ස්ථිර නිලධාරියකු / නිලධාරිණියක වශයෙන් සේවය කරන බවත්, ඔහු / ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අදාළ පුවත්පත් දැන්වීමේ ප්‍රකාරව ඔහු / ඇය මේ සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, පුවත්පත් දැන්වීමේ සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි.

....
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය : ....
නම : ....
තනතුර : ....
අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව : ....